ලංකා බැංකුවේ පූර්ණ අනුබද්ධිත ආයතනයක් වන බීඕසී අයිටී සොලියුෂන්ස් (පුද්ගලික) සමාගම විසින් පහත සඳහන් තනතුර සඳහා සුදුසුකම් ඇති උද්‍යෝගිමත් සහ ඵලදායී ප්‍රතිඵල හඹායන තරුණ තරුණියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

ලේඛන සහ තත්ත්ව පාලක (කොන්ත්‍රාත් පදනම)

1. අධ්‍යාපනික සුදුසුකම්

- තොරතුරු තාක්ෂණ හෝ ආශ්‍රිත ක්ෂේත්‍රයක පිළිගත් උපාධියක් **(ඔබගේ අයදුම්පත සමඟ පිටපතක් අමුණා එවන්න)**

2. වෘත්තීය සුදුසුකම්

තොරතුරු තාක්ෂණ විෂයයන් පිළිබඳ පහත සඳහන් වෘත්තීය සහතික තිබීම වඩාත් යෝග්‍ය වේ

- ISO 9001 සහතිකය
- ITIL පදනම් පාඨමාලාව, COBIT සහතික, ISO 20000 Implementor

3. සේවා පළපුරුද්ද

- සැකසුම් ලේඛන කළමනාකරණය / තත්ත්ව පාලනය පිළිබඳ අවම වශයෙන් අවුරුදු දෙකක (02) පළපුරුද්දක් තිබිය යුතුය
- තාක්ෂණික ලේඛනය පිළිබඳ පළපුරුද්ද, තත්ත්ව සහතිකකරණය සහ පාලනය පිළිබඳ පළපුරුද්ද මෙන්ම හොඳම ක්‍රමවේද සහ ප්‍රමිතීන් පිළිබඳ දැනුම

4. වයස් සීමාව

- අයදුම්පත් කැඳවන අවසන් දිනට වයස අවුරුදු 35 හෝ ඊට වඩා අඩුවිය යුතුය.

5. ගිවිසුම් කාලපරිච්ඡේදය

- මුළු කොන්ත්‍රාත් කාලය වසර 03 කි. (වාර්ෂික ප්‍රගති සමාලෝචනයට යටත්ව)

6. වැටුප් පරිමාණය

- සාකච්ඡා කළ හැක. අයදුම්කරුගේ නිපුණතාව මත ආකර්ෂණීය වැටුප් පැකේජයක් පිරිනැමේ.

7. වෙනත් සුදුසුකම්

- ස්වයං අභිප්‍රේරිත බව සහ ප්‍රතිඵල දිශාභිමුඛ බව
- ගැටලු නිරාකරණයේ විශිෂ්ටත්වය හා ඉහළ නව්‍යකරණමය හැකියාව

අයදුම්කිරීමේ පටිපාටිය

- අයදුම්කරුවන් සිය අයදුම්පත්, උපාධි සහතික සහ අවශ්‍ය වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික මෙන්ම අදාළ සෙසු සියලු අධ්‍යාපන සහතිකවල පිටපත් සමඟ අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද සනාථ කරන ලියකියවිලිවල ඡායාපිටපත් සමඟ උප්පැන්න සහතිකයේ සහ ජාතික හැඳුනුම්පතේ පිටපත් ලිපිකවරයක බහා අදාළ ලිපිකවරයේ වම් ඉහළ කෙළවර අයැදුම් කරන තනතුර සඳහන් කොට පහත ලිපිනයට **2026/11/25** දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් හෝ පහත සඳහන් ඊමේල් ලිපිනය ඔස්සේ යොමුකළ යුතුය.

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට ඉහත සඳහන් සුදුසුකම් සපුරා නොමැති නම් හෝ අදාළ ලියකියවිලිවල ඡායා පිටපත් රහිතව ඉදිරිපත් කරනු ලබන හෝ සාවද්‍ය තොරතුරු සපයන ලද සහ අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට පසුව ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් නැවත දැනුම්දීමකින් තොරව බැඳවා ගැනීමේ කාර්ය පාටිපාටියේ ඕනෑම අවස්ථාවක ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ප්‍රධාන විධායක නිලධාරී
බීඕසී අයිටී සොලියුෂන්ස් (පුද්ගලික) සමාගම,
18 වන මහල, ලංකා බැංකුව - ප්‍රධාන කාර්යාලය,
"ලංකා බැංකු චතුරස්‍රය", අංක 01, ලංකා බැංකු මාවත, කොළඹ 01.
දුරකථන: 011 476 4891
ඊමේල්: career@bocits.lk

BOC IT Solutions (Pvt) Ltd
(A fully owned subsidiary of the Bank of Ceylon)

• කිසියම් හෝ ආකාරයකින් බලපෑම් කිරීම වහාම නුසුදුසුකමක් බවට පත්විය හැකිය. • තෝරාගත් අපේක්ෂකයින් පමණක් කැඳවීමේ අයිතිය සමාගම සතුය.
• පිරවිය යුතු තනතුරු සංඛ්‍යාව හෝ බඳවා ගැනීම කල්දැමීමේ/ අවලංගු කිරීමේ අයිතිය සමාගම සතුය.